# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1833/11 - 2013 ඔක්තෝබර් මස 23 වැනි බදාදා - 2013.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.3/1992(III).

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත**

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 34 වන වගන්තිය සමඟ කියවිය යුතු 64 වන වගන්තිය යටතේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1993 නොවැම්බර් මස 26 වන දින අංක 794/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව වරින් වර සංශෝධිත පරිදි වූ 1993 අංක 1 දරන පතල් කැණීම් (බලපත්‍ර දීමේ) නියෝග එහි 33 වන නියෝගයේ (4) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" (4) විකුණුම්වලින් හෝ පතල් නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳ නිශ්චය කරන ලද වෙළඳ වටිනාකම අනුව හෝ අය කරන රාජ්‍ය භාග, ඛනිජ ද්‍රව්‍ය ආයෝජන ගිවිසුමෙහි අන්‍යාකාරයකින් සඳහන් වුවහොත් මිස, එම වටිනාකම්වලින් පහත දැක්වෙන ප්‍රතිශතයක් විය යුතු ය :-

| | | |
|---|---|---|
| අගනා ලෝහ වර්ග | - | සියයට 7 |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයනය නොකරන) | - | සියයට 6 |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයනික) | - | සියයට 7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | - | සියයට 4 |
| ගල් (අපනයන පාෂාණ) | - | සියයට 7 |
| පදනම් ලෝහ සහ වෙනත් ලෝහ | - | සියයට 6". |

11 - 213

1A - PG 01804 — 250 (2013/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*